# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# පුරප්පාඩු

කැලණිය විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. උපශාලාධිපති II ශ්‍රේණිය (පූර්ණ කාලීන) - භික්ෂු/කාන්තා

**සුදුසුකම්**

පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබිය යුතුය.

වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

නේවාසිකාගාර පරිපාලනය හා කළමනාකරණය පිළිබඳව පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය: U-MN 3 (II) රු 42,885 -18x660-54,765 (මාසික)**

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ)

**තෝරා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මගින්

(භික්ෂු නේවාසිකාගාරය සඳහා තෝරා ගැනීමේදී සුදුසුකම්ලත් භික්ෂූන් වහන්සේලා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය**

ඉල්ලුම්පත් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය. (www.kln.ac.lk) නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර **2020 අගෝස්තු මස 24 දින** හෝ ඊට පෙර ලැබෙන පරිදි **සහකාර ලේඛකාධිකාරී / ආයතන අනධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් හට වයස් සීමාව බල නොපාන අතර, ඔවුන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ, අපැහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ අයදුම්පත් කිසිදු හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී**
**කැලණිය විශ්වවිද්‍යාලය.**
**2020.08.04**